# DAC
# ඇගයීමේ නිර්ණායක
## උචිතබව

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දදායකයින්ට වඩාත් සමීප හා කාර්යක්ෂම නියෝජිතයන් වීමට ඔබ කැමැත්තක් දක්වන්නේද?

ඔබේ ඡන්දදායකයන් නියෝජනය කරමින් පාර්ලිමේන්තු විවාදවලදී නිසි ප්‍රශ්න මතු කරමින් රටේ සංවර්ධනය උපරිම කිරීමට හා එහි ප්‍රතිඵල ඔවුන්ට ලබාදීමට ඔබ උනන්දුවක් දක්වන්නේද?

එසේ නම් ඇගයීම පිළිබඳ **OECD DAC** නිර්ණායක ඔබට ප්‍රයෝජනවත් වියහැක. ඒ සඳහා මෙම කෙටි පත්‍රිකා මාලාව කියවන්න.

**ඇගයීම් පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකහරය වන්නේ පාර්ලිමේන්තුව තුලින් වගවීම, විනිවිදභාවය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. නීති සම්පාදනයේ ප්‍රමුඛයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රටේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවන්ය. පාර්ලිමේන්තු විවාදවලදී සංවර්ධන වැඩසටහන් පිළිබඳව හරවත් ප්‍රශ්න ඇසීම මගින් ඇගයීම් වලින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීමෙන්, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාවලියෙන් සම්පත් වෙන්කිරීමේදී පාර්ළිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලියට දායකවිය හැකිය.

සංවර්ධනය සඳහා වන මැදිහත්වීම් පිළිබඳ මනා අවබෝධය සමග ඒකාබද්ධ වූ OECD/DAC ඇගයීම් නිර්ණායක පුරවැසියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු විවාද සහ ආයෝජන කමිටු රැස්වීම්වලදී හරවත් ප්‍රශ්න ඇසීමට සහාය විය හැකිය.

මෙම පත්‍රිකා මාලාව තුලින් OECD/DAC නිර්ණායක හය පිළිබඳව විස්තර කරනු ලබයි.

## OECD/DAC ඇගයීම් නිර්ණායක

ඇගයීම් නිර්ණායක හය නම් උචිතබව, ඒකාබද්ධභාවය, සඵලතාව, කාර්යක්ෂමතාව, බලපෑම සහ තිරසාරභාවයයි. මෙම නිර්ණායක ඇගයීම් සමග භාවිත කිරීම සඳහා සකස් කර ඇතත්, රටක ඕනෑම සංවර්ධන වැඩසටහනක්, ව්‍යාපෘතියක් හෝ ප්‍රතිපත්තියක් පිළිබඳ ප්‍රබල ප්‍රශ්න සැකසීමටද ඒවා භාවිතකළ හැකිය. එබැවින් OECD/DAC නිර්ණායක, කරුණු මත පදනම් වූ තීරණ ගැනීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වැදගත් වේ.

## උචිතබව

OECD/DAC මගින් සංවර්ධන වැඩසටහන් කොතරම් දුරට නිවැරදි දේ සිදුකරයිද යන්න උචිතබව ලෙස නිර්වචනය කරයි.

එනම්, කොතරම් දුරට සංවර්ධන වැඩසටහන්වල අරමුණු සහ සැලසුම ප්‍රතිලාභීන්ගේ, ගෝලීය, රට, සහ හවුල්කරුවන්/ ආයතන අවශ්‍යතා, ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දක්වන ප්‍රමාණය සහ යම් හෙයකින් තත්ත්වය වෙනස් වීමකට භාජනය වුවහොත් (සංවර්ධන වැඩසටහන් මගින් සිදුවන ආර්ථික, පාරිසරික, සාධාරණත්ව, සමාජ, දේශපාලන ආර්ථිකය, සහ ධාරිතාව පිළිබඳ තත්ත්වයන් ඇතුළුව) එය අඛණ්ඩව පවත්වාගෙනයාම.

## මූලික අර්ථ දැක්වීම්

ප්‍රතිචාර දැක්වීම යන්නෙන් අදහස් කරන්නේ සංවර්ධන වැඩසටහන් වල අරමුණු සහ සැලසුම එය සිදුවන ආර්ථික, පාරිසරික, සාධාරණත්ව, සමාජ, දේශපාලන ආර්ථිකය සහ ධාරිතා තත්ත්වයන්ට බලපාන බවයි.

සංවර්ධන වැඩසටහන් වලින් ඍජුව හෝ වක්‍රාකාරයෙන් ප්‍රතිලාභ ලබන, ඉලක්කගත හෝ ඉලක්කගත නොවූ පුද්ගලයන්, කණ්ඩායම් හෝ සංවිධාන ප්‍රතිලාභීන් ලෙස අර්ථදැක්වේ. වෙනත් අතකින් හිමිකම් දරන්නන් හෝ බලපෑමට ලක් වූ පුද්ගලයන් වැනි වෙනත් පදද මේ සඳහා භාවිත කළ හැක.

හවුල්කරුවන්/ආයතන යනු අරමුදල් දීම, ක්‍රියාත්මක කිරීම සහ/හෝ අධීක්ෂණය කිරීම මගින් මැදිහත් වන රාජ්‍ය (ජාතික, කලාපීය, ප්‍රාදේශීය) සිවිල් සමාජ සංවිධාන, පුද්ගලික ආයතන සහ ජාත්‍යන්තර ආයතනවේ.

උචිතබව තක්සේරු කිරීමට විවිධ ප්‍රමුඛතා හෝ අවශ්‍යතා අතර ඇති වෙනස්කම් සහ ගළපාගැනීම් සලකාබලයි. මැදිහත්වීම අදාළ ලෙස පවතින පරිදි සකස් කළ හැකි (හෝ සකස් කර ඇති) ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අන්තර්ගතය තුළ ඇතිවන කිසියම් හෝ වෙනස්කමක් විශ්ලේෂණය කිරීම එහි අවශ්‍යතාවක් වේ.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උචිතබව පිළිබඳ නිර්ණායක භාවිත කළ හැකි ආකාරය

රාජ්‍ය සංවර්ධන වැඩසටහන් රැසක් පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්කෙරේ. එවැනි සංවර්ධන වැඩසටහන් ජනතාවගේ අවශ්‍යතාවලට අදාළව පවතිනබව සහතික කිරීම වැදගත් පාර්ලිමේන්තු වගකීමකි. මැදිහත්වීම්වල උචිතබව පිළිබඳ නිසි ප්‍රශ්න මතුකිරීමෙන් ක්‍රියාකාරී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තම ඡන්ද දායකයින්ගේ සැබෑ අවශ්‍යතා නියෝජනය කළ හැකිය.

පරිපූර්ණ වශයෙන්, පාර්ලිමේන්තුව රාජ්‍ය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ උචිතබව සහතික කළ යුතුය. කෙසේ වෙතත්, සැබෑ ලෙසම සිදුවන්නේ බොහෝ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පැහැදිලි ආරම්භයක් හෝ අවසානයක් නොමැතිව ක්‍රියාත්මකවෙමින් පැවතීමයි. එබැවින් පුරවැසියන්ගේ අවශ්‍යතා සපුරාලන සංවර්ධන වැඩසටහන් සහ ප්‍රතිපත්ති ප්‍රමාණය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට එම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පවතින උචිතබව පිළිබඳ ප්‍රශ්න උපකාරී වේ. උචිතබව යටතේ සාකච්ඡා කළ හැකි ප්‍රධාන ක්ෂේත්‍ර ගණනාවක් තිබේ.

- සංවර්ධන වැඩසටහන් සත්‍ය වශයෙන්ම ජනතාවගේ අවශ්‍යතා මත පදනම් වී තිබේද යන්න
- නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගෙන ඇතුළත් කර තිබේද යන්න
- නිවැරදි පාර්ශ්වකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ අදහස් විමසා තිබේද යන්න
- සංවර්ධන වැඩසටහන් අදාළ රාජ්‍ය ආයතන සහ හවුල්කරුවන් විසින් සලකාබලන ප්‍රමුඛතා හඳුනාගෙන ඇති ද යන්න
- අන්තර්ගතය වෙනස් වන තත්වයන් තුළදී වුවත් තවදුරටත් එහි උචිතබව පවත්වා ගෙන යාමට සංවර්ධන වැඩසටහන හෝ ප්‍රතිපත්තිය වෙනස් කළ හැකිද යන්න

## උචිතබව සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇසිය හැකි ප්‍රශ්න

සංවර්ධන වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ ප්‍රතිපත්තියක උචිතබව තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඇසිය හැකි ප්‍රශ්න සඳහා නිදසුන් පහත දැක්වේ. කෙසේ වෙතත්, ප්‍රශ්න විමසීමේදී නිර්මාණශීලීවීම, රටේ සන්දර්භය සැලකිල්ලට ගැනීම, සංවර්ධන වැඩසටහන් හෝ ප්‍රතිපත්තියේ ස්වභාවය සහ විවාදයේ සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

**අඃ** ප්‍රතිලාභ ලැබීමට සුදුස්සන්ගේ සැබෑ අවශ්‍යතා සලකා බලා සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති/ ප්‍රතිපත්ති සැලසුම් කර තිබේද?

**ආඃ** වැඩසටහනේ මූලික හරය ඔස්සේ අවධානයට ලක්විය යුතු දේ තීරණය කිරීමට භාවිත කර ඇති කරුණු මොනවාද?

**ඇඃ** සංවර්ධන වැඩසටහන හෝ ප්‍රතිපත්තිය සැලසුම් කිරීමේදී ප්‍රතිලාභීන්ගේ අදහස් විමසුවේද?

**ඈඃ** තෝරාගත් ප්‍රතිලාභීන් රජයේ සහයෝගය ලැබියයුතු ප්‍රමුඛයන් අතර සිටින්නේද?

**ඉඃ** සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති/ ප්‍රතිපත්ති ජාතික ප්‍රමුඛතා සහ සැලසුම්වල සමග කෙතරම් අනුබද්ධ වන්නේද?

**ඊඃ** සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති/ ප්‍රතිපත්තිය තිරසාර සංවර්ධන ඉලක්ක සමග කෙතරම් අනුබද්ධ වන්නේද?

**උඃ** සංවර්ධන වැඩසටහන් සමාජ/ ආර්ථික/ පාරිසරික අන්තර්ගතය තුළ සිදුවන වෙනස්කම්වලට කෙතරම් හොඳින් අනුගත වී තිබේද?

**ඌඃ** සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති/ ප්‍රතිපත්තිය එය ක්‍රියාත්මකවන කාලය පුරා ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවලට අදාළ ලෙස තවදුරටත් පවතින්නට ඉඩ තිබේද?

## උචිතබව පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර


OECD evaluation criteria, retrieved from *https://tinyurl.com/2p9835a6*

OECD (2022) Understanding the six criteria: Definitions, elements for analysis and key challenges. retrieved from *https://tinyurl.com/bddeffx8*



**ප්‍රකාශනය**

Asia Pacific Parliamentarians Forum for Evaluation

APEA Asia-Pacific Evaluation Association

Global Parliamentarians Forum for Evaluation

විමසීම්: apea.coordinator@gmail.com

**සිංහල පරිවර්තනය**

SLEvA Sri Lanka Evaluation Association

විමසීම්: sleva.sec@gmail.com